// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2206/18 - 2020 දෙසැම්බර් මස 18 සිකුරාදා - 2020.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, ෂැන්ග්‍රි-ලා හොටෙල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගමට අදාළව 2016 ජූලි මස 05 වැනි දින අංක 1974/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ,* 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද පසුකාලීන නියම මගින් සංශෝධිත 2011 ජූලි මස 11 වැනි දින අංක 1714/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ 3 වන වගන්තියේ (4) වන වගන්තිය යටතේ පළ කරන ලද නියමයට තවදුරටත් වශයෙන්, මෙම නියමය මගින් -

> 2016 ජූලි මස 05 වැනි දින අංක 1974/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ,* 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත්කරන ලද පසුකාලීන නියම මගින් සංශෝධිත 2011 ජූලි මස 11 වැනි දින අංක 1714/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ (4) වන වගන්තිය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානය කරන ලද කාලසීමාව දීර්ඝ කිරීමේ අරමුණින් යුතුව පහත දැක්වෙන ලෙස කියවෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. එනම් -
>
> "(4) බස්නාහිර පළාතේ කොළඹ 01, කොළඹ කොටුව යන ස්ථානයේ පිහිටි ඉහළ තත්ත්වයේ පදිංචි සහ සුපිරි සාප්පු සංකීර්ණයක් ඇතුළු මිශ්‍ර උපයෝගිතා වෙළෙඳ සංකීර්ණයක් ලෙස සුඛෝපභෝගී හෝටලයක් ඉදිකිරීම සඳහා වූ ඉහත කී ව්‍යාපෘතිය විසින් 2020 ජුනි මස 30 වන දින වානිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතුය ."

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

01 - 619